ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ උද්‍යයන උපාධි පාඨමාලාව - සිව්වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2006/2007
සාර්ව ආර්ථික විද්‍යාව - MCU 2207

කාලය : පැය තුනයි

දිනය: 10.02.2007 වේලාව : ප. ව. 1.30 – ප.ව 4.30

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.

1. (i) රටක ප්‍රධාන සාර්ව ආර්ථික අරමුණු කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 6)

(ii) කළමනාකරුවෙකුට සාර්ව ආර්ථික විද්‍යාව අධ්‍යයනය කිරීමේ වටිනාකම උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
(ලකුණු 14)

2. (i) ඉතිරි කිරීම් සහිත ද්වි අංශික ආර්ථිකයක ආදායමේ චක්‍රීය චලනය යනු කුමක්ද?
(ලකුණු 5)

(ii) ත්‍රිත්ව අංශ ආර්ථිකයකට අදාළ පහත තොරතුරු සලකන්න.
ආයෝජන $\bar{I}$ = බිලියන 80
රජයේ වියදම් $\bar{G}$ = බිලියන 100
ඉතුරුම් S = $-60 + 0.2y$

(අ) පරිභෝජන ශ්‍රිතය කුමක්ද? (ලකුණු 2)
(ආ) ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 3)
(ඇ) රජය රුපියල් බිලියන 10 ක එක්වර බද්දක් (Lump-sum tax) පැනවූයේ යැයි සිතන්න. නව ජාතික ආදායම සොයන්න.
(ලකුණු 4)
(ඉ) ඉහත ආර්ථිකය තුළ පහත වෙනස්කම් සිදු වූයේ යැයි සිතන්න. මෙම රට අන්තර් ජාතික වෙළදාම සඳහා යොමු වූන අතර අපනයන (X) රුපියල් බිලියන 60 ක් වන අතර ආනයන $M = 30 + 0.2y$ වේ. ඉහත එක්වර බද්දට අමතරව රජය විසින් $0.1y$ ක ආදායම් බද්දක්ද පනවන ලදැයි සිතන්න. නව ජාතික ආදායම ගණනය කරන්න.
(ලකුණු 6)

3. (i) මුදල් ලග තබා ගැනීම සඳහා වන ත්‍රිත්ව චේතනා කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 5)

(ii) "ද්‍රවශීලතා උගුලකදී ප්‍රසාරනාත්මක පිස්කල් ප්‍රතිපත්තීන් වඩාත් ඵලදායි වන අතර මූල්‍ය ප්‍රතිපත්තීන් මුළුමනින්ම නිශ්චල වේ." ඔබ එකග වන්නේද? ප්‍රස්ථාර ඇසුරින් පැහැදිලි කරන්න.
(ලකුණු 9)

(iii) IS-LM රාමුව ආශ්‍රයෙන් පහත දී ඇති තත්වයන්ගේ ප්‍රතිඵලයන් පැහැදිලි කරන්න,
(අ) මහ බැංකුව විසින් වාණිජ බැංකු තැම්පතු අවශ්‍යතා පහත දැමීම
(ආ) රජය විසින් රජයේ වියදම් වැඩි කිරීමට යෝජනා කිරීම්
(ඇ) රටක මිල මට්ටම් ඉහළ යැම්
(ලකුණු 2 x 3 =6)

4. (i) ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය සහ පිරිවැය යැතුම් උද්ධමනය අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 8)

(ii) රටක ආර්ථිකය කෙරෙහි උද්ධමනයෙහි අහිතකර බලපෑම කුමක්දැයි පහදන්න.

(ලකුණු 12)

5. (i) ප්‍රේරිත සේවා වියුක්තිය (Induced unemployment) යනු කුමක්ද?

(ලකුණු 4)

(ii) ගැටුම් සහ ව්‍යුහාත්මක සේවා වියුක්තීන් අවම කර ගැනීම සඳහා රජය විසින් ගත යුතු පියවරයන් මොනවාද?

(ලකුණු 6)

(iii) "නිල සේවා වියුක්ති අනුපාතය ආර්ථිකයක ක්‍රියාකාරිත්වය මිනීම සඳහා හොඳ ඉගියක් වුවද එහි ඇතැම් දුර්වලතා ඇත." ඔබ එකග වන්නේදැයි පහදන්න.

(ලකුණු 10)

6. (i) මන්දාවධමන පරතරය (recessionary gap) ඉවත් කිරීම සඳහා රජයට පිස්කල් ප්‍රතිපත්තීන් යොදා ගත හැක්කේ කෙසේදැයි පහදන්න.

(ලකුණු 6)

(ii) ගුණක සංකල්පය මෙවැනි පිස්කල් ප්‍රතිපත්තීන් සඳහා සම්බන්ධ කර ගන්නේ කෙසේද? එවැනි ප්‍රතිපත්තීන්ගේ වාසි අවාසි කවරේද?

(ලකුණු 14)

7. (i) ආදායම් ප්‍රවේගය (Income velocity) පිළිබඳ සම්භාව්‍යවාදීන්, කේනිසියානුවන් සහ මුල්‍යවාදීන්ගේ දැක්මන් එකනෙකට වෙනස් වන්නේ කෙසේද?

(ලකුණු 6)

(ii) මුදල් සැපයුම සහ මිල මට්ටම් පිළිබඳව කේනිසියානු ප්‍රවේශය සම්භාව්‍ය ප්‍රවේශයෙන් වෙනස් වන්නේ කෙසේද?

(ලකුණු 14)

8. කෙටි සටහන් ලියන්න

(i) ඉතුරුම් ශ්‍රිතය
(ii) මුදල් ආර්ථිකයෙහි ගතිග කාර්යයක් ලෙස
(iii) නාමික සහ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය
(iv) පටු සහ පුළුල් මුදල් සැපයුම.

(ලකුණු 5 x 4 = 20)

-හිමිකම් ඇවිරිණි -